# ප්‍රසම්පාදන දැන්වීමයි

## සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ වනිතා
## කටයුතු අමාත්‍යාංශය.
## සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සහ වනිතා කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් කර්මාන්ත ඉටුකිරීම සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | විධායක ඉංජිනේරු කොට්ඨාශය | වැඩ විස්තරය | ලියාපදිංචි ශ්‍රේණිය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු |
|---|---|---|---|---|
| HM/2011/15 (01) | ඇඹිලිපිටිය | ඇඹිලිපිටිය මූලික රෝහලේ නව ශල්‍යාගාරය ඉදිකිරීම | C5 | රු. 3,500.00 |
| HM/2011/16 (02) | ඇඹිලිපිටිය | හල්මිල්ලආර සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම | C8 | රු.2,000.00 |
| HM/2011/17 (03) | රත්නපුර | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නිළනිවස අළුත්වැඩියාව (ඉතිරිවැඩ) | C8 | රු.2,000.00 |
| HM/2011/18 (04) | රඹුක්කන | මාවනැල්ල මූලික රෝහලේ අංක 2 හා 3 ශල්‍යාගාරයන්හි ඉතිරි වැඩ කොටස් නිම කිරීම | C 8 | රු.2,000.00 |

<u>ඉහත (01), (02), (03) කර්මාන්ත</u>

සබරගමුව පළාත් සභාවේ හෝ ඉදිකිරීම් කර්මාන්ත පුහුණු හා සංවර්ධන ආයතනයේ ගොඩනැගිලි විෂය යටතේ ඉහත සඳහන් වටිනාකමට හෝ ඊට වැඩි වටිනාකමකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවෝ ටෙන්ඩර් අයදුම් කිරීමට සුදුස්සෝ වෙති.

<u>ඉහත (04) කර්මාන්තය</u>

සබරගමුව පළාත් සභාවේ හෝ ඉදිකිරීම් කර්මාන්ත පුහුණු හා සංවර්ධන ආයතනයේ ගොඩනැගිලි විෂය යටතේ ඉහත සඳහන් වටිනාකමට හෝ ඊට වැඩි වටිනාකමකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවෝ හෝ ශල්‍යාගාර අභ්‍යන්තර සකස් කිරීම් ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් ලබා ඇති කොන්ත්‍රාත්කරුවෝ (ප්ලාස්ටික් වයිනයිල් ටයිල් යොදා ශල්‍යාගාරයන්හි බිම සකස් කිරීමට නියමිත බැවින්) ටෙන්ඩර් අයදුම් කිරීම සඳහා සුදුස්සෝ වෙති.

03. 2011 සැප්තැම්බර් මස 16 දින සිට ඔක්තෝම්බර් මස 06 දින දක්වා, සතියේ වැඩ කරන දින වල පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා මෙම කාර්යාලයේ ගිණුම් අංශයෙන් ඉහත සඳහන් පරිදි ගාස්තු ගෙවීමෙන් ප්‍රසම්පාදන ලේඛණ ලබා ගත හැකිය.

04. සියලුම ලංසුකරුවන් ටෙන්ඩර් කොන්දේසිවලට අනුකූලව ලංසු බැදුම්කර වශයෙන් පිළිගත් වානිජ බැංකුවකින් ලබාගත් බැදුම්කරයක් හෝ අමාත්‍යාංශ ලේකම් වෙත අදාළ මුදල් බැර කර ලබා ගත් රිසිට් පත ලංසු ලේඛණ සමග ඉදිරිපත් කළ යුතු අතර සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන 2011 ඔක්තෝම්බර් මස 07 දින පෙ.ව.10.00 ට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අමාත්‍යංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ යුතුය. මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය. සෑම ටෙන්ඩරයක් සඳහාම අනුපිටපතක් ඒ බව කවරයේ සඳහන් කරමින් වෙනම කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.

05. 2011 ඔක්තෝම්බර් මස 07 වන දින පෙ.ව. 10.15 ට ලංසු පත් විවෘත කරනු ලබන අතර, ලංසු කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

06. මෙම ලංසු කැඳවීම සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් කාර්යාල වේලාවන් තුලදී අවශ්‍ය විස්තර අමාත්‍යාංශ කාර්යාලයෙන් ලබා ගත හැකි අතර සාර්ථක ලංසු කරුවන්ට ලංසු පිරිනැමීම ඔවුන්ගේ ලියාපදිංචි වටිනාකමට සීමා කරුණු ඇත. ටෙන්ඩර් පත් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර අවසන් තීරණය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

මෙම දැන්වීම අන්තර්ජාලයේ www.sg.gov.lk ලිපිනයෙන් ද ලබා ගත හැකිය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සහ
වනිතා කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය, රත්නපුර

2011 සැප්තැම්බර් මස 16
දුක.අ. – 045 - 2222542